# විනයාරක්ෂක පුවත්

2025 පළමු කාලාපය



## අභිනව කර්නල් සේනාවිධායක තුමා රාජකාරි ආරම්භ කිරීම







ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ 14 වන කර්නල් සේනාවිධායක වශයෙන් මේජර් ජෙනරාල් බිජීඑස් ප්‍රනාන්දු යූඑස්පී එච්ඩීඑම්සී පීඑස්සි ජ්‍යෙෂ්ඨ නිලධාරි 2025 ජූලි මස 11 වන දිනට යෙදුන සුභ මොහොතින් සිය තනතුරේ රාජකාරි ආරම්භ කරන ලදී. එම අවස්ථාව සම්ප්‍රදායානුකූලව ලබාදෙනු ලබන කඳවුරු මුරය සහ සම්මාන මුරයකින් සමන්විත විය. එහිදී කර්නල් සේනාවිධායක විසින් සියලු නිලයින් ආමන්ත්‍රණය කිරීම සිදුකළ අතර, වැඩසහන අවසානයේ සියලු නිල තේ පැන් සංග්‍රහයක් පවත්වන ලදී.

**ආදර්ශයෙන් පෙරමුණ ගනිමු**

https://alt.army.lk/slcmp/

## 13 වන කර්නල් සේනාවිධායකගේ නික්මයාම




මෙම රෙජිමේන්තු 13 වන කර්නල් සේනාවිධායක වශයෙන් රාජකාරි කළ මේජර් ජෙනරාල් යුඑල්ජේඑස් පෙරේරා ආර්එස්පී යුඑස්පී එන්පීඑස් පීඑස්සී ජ්‍යෙෂ්ඨ නිලධාරි විශ්‍රාම ගැන්වීම වෙනුවෙන් 2025 ජූලි මස 03 වන දින රෙජිමේන්තු මධ්‍යස්ථානයේදි සම්ප්‍රදායානුකූලව අලංකාරවත් කඳවුරු මුරයක් සහ සම්මාන මුරයක් පිරිනැමිණි. ඊට සමගාමීව කර්නල් සේනාවිධායක විසින් සියලු නිලයින් අමතා එම ජ්‍යෙෂ්ඨ නිලධාරි කර්නල් සේනාවිධායක වශයෙන් රාජකාරි කරන ලද කාලසීමාවේදි ඔහුගේ රාජකාරිය ඉටු කිරිමට ඔහුට ලබාදුන් සහයෝගය වෙනුවෙන් ස්තූතිය සියලු නිලයින් හට පුදකරන ලදි.






## විනයාරක්ෂක ජ්‍යෙෂ්ඨයකුගේ නික්මයාම






වසර 34 කට ආසන්න ගෞරවනීය යුද හමුදා සේවා කාලයක් සම්පූර්ණ කරන ලද බ්‍රිගේඩියර් එච්එම්එස්අයි සෙනරත් ජ්‍යෙෂ්ඨ නිලධාරි යුද්ධ හමුදා සේවයෙන් විශ්‍රාම ගැනීම වෙනුවෙන් 2025 මැයි මස 10 වන දින සම්ප්‍රදායානුකූල වැඩසටහනක් රෙජිමේන්තු මධ්‍යස්ථානයේ පැවැත්විනි.

එමෙන්ම එදින පස්වරුවේ තත් ජ්‍යෙෂ්ඨ නිලධාරි හට නිලධාරි නිවස්නයේදි සම්ප්‍රදායික සමුගැනීමේ රාත්‍රී භෝජන සංග්‍රහයක් පවත්වන ලදී.

## මධ්‍යස්ථාන සේනාවිධායක තනතුරේ රාජකාරි අත්හැරීම







ශ්‍රී ලංකා යුද්ධ හමුදා පොලිස් හේවා බලකායේ 18 වන මධ්‍යස්ථාන සේනාවිධායක ලෙස රාජකාරි කරන ලද බ්‍රිගේඩියර් එම් එම් එම් පී මහේෂ්කුමාර ජ්‍යෂ්ඨ නිලධාරි 2025 අගෝස්තු මස 15 දින සිය ධුරයේ රාජකාරි අත්හරින ලදි. ඊට සමගාමීව යුද්ධ හමුදා සම්ප්‍රදායානුකූලව කඳවුරු මුරයක්, සම්මාන පෙලපාලියක් ඇතුලු අනෙකුත් වැඩසටහන් රෙජිමේන්තු මධ්‍යස්ථානයේදි පැවැත්විය.



## 19 වන මධ්‍යස්ථාන සේනාවිධායක තනතුරේ රාජකාරි භාරගැනීම

ශ්‍රී ලංකා යුද්ධ හමුදා පොලිස් හේවා බලකායේ 19 වන මධ්‍යස්ථාන සේනාවිධායක ලෙස බ්‍රිගේඩියර් ආර්එම්කේජ්එස් රාජනායක ජ්‍යෂ්ඨ නිලධාරි 2025 අගෝස්තු මස 16 වන දිනට යෙදුනු සුභ මොහොතින් සිය ධුරයේ රාජකාරි ආරම්භ කරන ලදි. ඊට සමගාමීව 2025 අගෝස්තු මස 18 වන දින යුද්ධ හමුදා සම්ප්‍රධායානුකූලව කඳවුරු මුරයක්, සම්මාන පෙලපාලියක් ඇතුලු අනෙකුත් වැඩසටහන් රෙජිමේන්තු මධ්‍යස්ථානයේදි පැවැත්විය.

## විනයාරක්ෂක අම වෙතින් සංවිධානය කරන ලද දේශණය



ශ්‍රී ලංකාව තුළ තහනම් මත්ද්‍රව්‍ය භාවිතය ප්‍රචලිත වීමත් සමග එහි අහිතකර බලපෑම අනෙකුත් සෑම අංශයකට මෙන්ම ශ්‍රී ලංකා යුද්ධ හමුදාව වෙතද සැළකිය යුතු ප්‍රමාණයකින් බලපෑම් එල්ල කර ඇත. ඒ සඳහා මත්ද්‍රව්‍ය භාවිතය වලක්වා ගැනීමේ පියවරක් වශයෙන් යුද්ධ හමුදාවේ සියලු නිලයින් ආවරණය වන පරිදි විනයාරක්‍ෂාධිපතිගේ උපදෙස් පරිදි විනයාරක්‍ෂක අධ්‍යක්‍ෂක මණ්ඩලය වෙතින් දැනුවත් කිරීමේ දේශණයක් 2025.03.12 වන දින හෝරා 0900 සිට හෝරා 1200 දක්වා යුද්ධ හමුදා මුලස්ථානයේදී පවත්වන ලදි. එම දේශණය ශ්‍රී ලංකා පොලිස් දෙපාර්තුමේන්තුවේ පොලිස් මත්ද්‍රව්‍ය දිසාවේ අධ්‍යක්‍ෂක නියෝජ්‍ය පොලිස්පති ඔෂාන් හේවාවිතාරණ යන ජ්‍යෂ්ඨ නිලධාරීගේ සහභාගීත්වයෙන් යුතුව පවත්වනු ලැබීය.







## මියගිය රණවිරුවන් සඳහා උපහාර දැක්වීම





35 වන රෙජිමේන්තු දින සංවත්සරයට සමගාමීව ක්‍රියාන්විත රාජකාරියේ යෙදී සිටියදී තම ජීවිත පරිත්‍යාගයන් සිදු කළ රණවිරුවන් හට උපහාර දැක්වීමේ උත්සවය 2025 මාර්තු 14 වන දින ගිරිතලේ රණවිරු ස්මාරකය ඉදිරිපිටදි පැවැත්විනි.

ශ්‍රී ලංකා යුද්ධ හමුදා යුද සේවා ලේකම් මෙන්ම ශ්‍රී ලංකා යුද්ධ හමුදා පොලිස් හේවා බලකායේ කර්නල් සේනාවිධායක මේජර් ජෙනරාල් යුඑල්ජේඑස් පෙරේරා ආර්එස්පි යුඑස්පි එන්පිඑස් පිඑස්සි ජ්‍යෂ්ඨ නිලධාරි, ශ්‍රී ලංකා යුද්ධ හමුදා විනයාරක්ෂකාධිපති බ්‍රිගේඩියර් ආර්ඩි සලේ ජ්‍යෂ්ඨ නිලධාරි, මධ්‍යස්ථාන සේනාවිධායක එම්එම්එම්පි මහේෂ් කුමාර ජ්‍යෂ්ඨ නිලධාරි මෙන්ම අනෙකුත් ජ්‍යෂ්ඨ නිලධාරින්, නිලධාරින් නිලධාරිනියන්, සෙසුනිලයින් හා මියගිය රණවිරුවන්ගේ ලගම ඥාතීන්ද සහභාගි වන ලදි.

## ශ්‍රී ලංකා යුද්ධ හමුදා පොලිස් හේවා බලකායේ රාජකාරි කරනු ලබන සිවිල් සේවක මහත්ම/මහත්මීන් හට සිංහල හින්දු අලුත් අවුරුද්දට සමගාමීව වව්චර් ත්‍යාග ලබා දෙයි

සිංහල සහ හින්දු අලුත් අවුරුද්දේ සැබෑ අරුත සහ හෘදයාංගම කෘතඥතාව පළ කිරීමේ අවස්ථාවක් ලෙස ශ්‍රී ලංකා යුද්ධ හමුදා පොලිස් හේවා බලකායේ රෙජිමේන්තු මධ්‍යස්ථානයේ රාජකාරි කරනු ලබන සිවිල් කාර්ය මණ්ඩලයට තෑගි වවුචර් බෙදාදීමේ උත්සවයක් 2025 අප්‍රේල් මස 11 වන දින පවත්වන ලදී.

එම අවස්ථාව සඳහා ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ යුද සේවා ලේකම් සහ ශ්‍රී ලංකා යුද්ධ හමුදා පොලිස් හේවා බලකායේ කර්නල් සේනාවිධායක මේජර් ජෙනරාල් යූඑල්ජේඑස් පෙරේරා ආර්එස්පී යූඑස්පී එන්පීඑස් පීඑස්සී යන ජ්‍යෙෂ්ඨ නිලධාරි සහ මධ්‍යස්ථාන සේනාවිධායක බ්‍රිගේඩියර් එම්එම්එම්පී මහේෂ් කුමාර ජ්‍යෙෂ්ඨ නිලධාරි සහභාගි විය.





## 35 වන රෙජිමේන්තු දින සැමරුම් උත්සවය ආගමික වතාවත් වලට මුල්තැන දෙමින් ආරම්භ කිරීම















35 වන රෙජිමේන්තු දින සංවත්සරය සමගාමීව 2025 මාර්තු 27 වන දින රාත්‍රී පිරිත් සජ්ඣායනයක් ශ්‍රී ලංකා යුද්ධ හමුදා පොලිස් හේවා බලකායේ රෙජිමේන්තු මධ්‍යස්ථානයේදී පැවැත්විය. වාර්ෂික සංවිධානය කරනු ලබන මෙම පිරිත් සජ්ඣායනාව අලංකාරවත් පෙරහැරකින් ස්වාමින් වහන්සේලා කඳවුර වෙත වැඩම කරමින් ආරම්භ කරන ලදී.

මෙම උත්සවය ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ යුද සේවා ලේකම් මෙන්ම ශ්‍රී ලංකා යුද්ධ හමුදා පොලිස් හේවා බලකායේ කර්නල් සේනාවිධායක මේජර් ජෙනරාල් යූඑල්ජේඑස් පෙරේරා ආර්එස්පී යූඑස්පි එන්පිඑස් පිඑස්සි ගේ මූලිකත්වයෙන් පැවැත්විනි. තවද, එම අවස්ථාව සඳහා මියගිය විරෝධාර රණවිරුවන්ගේ ලඟම ඥාතීන් ද සහභාගි විය.

පිරිත් සජ්ඣායනාව අවසානයේ භික්ෂූන් වහන්සේලා 15 නමක් වෙනුවෙන් හීල් දානමය පිංකම මෙම රෙජිමේන්තු මධ්‍යස්ථාන පරිශ්‍රයේදී පිරිනමන ලදී. මෙම අවස්ථාව සඳහා ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ විනයාරක්ෂකාධිපති බ්‍රිගේඩියර් ආර්ඩී සලේ එන්ඩිසි ජ්‍යෙෂ්ඨ නිලධාරි මධ්‍යස්ථාන සේනාවිධායක බ්‍රිගේඩියර් එම්එම්එම්පී මහේෂ් කුමාර ජ්‍යෙෂ්ඨ නිධාරි මෙන්ම අනෙකුත් ජ්‍යෙෂ්ඨ නිලධාරින්, නිලධාරින්, නිලධාරිනියන්, සෙසුනිලයින් සහභාගි වන ලදී.

# අභිමානවත් 35 වන රෙජිමේන්තු දින සැමරුම් උත්සවය














ශ්‍රී ලංකා යුද්ධ හමුදා පොලිස් හේවා බලකා රෙජිමේන්තුව 35 වන සංවත්සරය සාම්ප්‍රදායික වැඩසටහන් වලින් සමන්විත උත්සවය 2025.04.25 දින රෙජිමේන්තු මධ්‍යස්ථානයේදි පවත්වන ලදී. එහිදි, කර්නල් සේනාවිධායක තුමන් වෙත අලංකාරවත් කඳවුරු මුරයයක්, සම්මාන මුරයක් පිරිනමන ලදී.

අනතුරුව සියලු නිල දිවා භෝජන සංග්‍රහය කෝප්‍රල් සමාජ ශාලාවේ පැවැත්විනි. එදින පස්වරුවේ සියලු නිල සුහද හමුව කර්නල් සේනාවිධායක තුමාගේ ප්‍රධානත්වයෙන් සියලු නිලයින්ගේ සහභාගීත්වයෙන් පවත්වා 35 වන සංවත්සර උත්සවයේ වැඩසටහන අවසන් කරන ලදි.

## උතුම් දාන පාරමිතාව වෙනුවෙන් වෙසක් පොහොය දින පෙළගැසුනු විනයාරක්ෂක පවුලේ සාමාජිකයින්









වෙසක් පුර පසළොස්වක පොහොය දිනයට සමගාමීව 2025 මැයි 13 වන දින සන්ධ්‍යාවේ ශ්‍රී ලංකා හමුදා පොලිස් හේවා බලකාය සහ විනයාරක්ෂක සේවා වනිතා ශාඛාව සමග එක්ව මඤ්ඤොක්කා, කොස්, කඩල සහ කිරි කෝපි දන්සලක් රෙජිමේන්තු මධ්‍යස්ථානය ඉදිරිපිටදී පවත්වන ලදී.

එම අවස්ථාව සඳහා ශ්‍රී ලංකා යුද හමුදාවේ යුධ සේවා ලේකම් සහ ශ්‍රී ලංකා යුද හමුදා පොලිස් හේවා බලකායේ කර්නල් සේනාවිධායක මේජර් ජෙනරාල් යූඑල්ජේඑස් පෙරේරා ආර්එස්පී යූඑස්පී එන්පීඑස්සී සහ සේවා වනිතා ශාඛාවේ සභාපතිනි ඉරේෂා පෙරේරා මහත්මිය මෙන්ම, ශ්‍රී ලංකා යුද හමුදාවේ විනායරක්ෂකාධිපති බ්‍රිගේඩියර් ආර්ඩී සලේ එන්ඩීසී ශ්‍රී ලංකා යුද හමුදා පොලිස් හේවා බලකායේ මධ්‍යස්ථාන සේනාවිධායක බ්‍රිගේඩියර් එම්එම්එම්පී මහේෂ් කුමාර ඇතුළු නිලධාරින් සහ සෙසුනිලයින් සහභාගී විය.

## විනයාරක්‍ෂක ජ්‍යෙෂ්ඨ නිලධාරින් සේවයෙන් නික්මයාම









ශ්‍රී ලංකා යුද්ධ හමුදා පොලිස් හේවා බලකාය වෙත ගෞරවනීය සේවයක් ඉටුකළ ලුතිතන් කර්නල් ඒඑම්ඒයූඑස් අලගියවන්න, ලුතිතන් කර්නල් ඒඑම්පීබී අබේසිංහ සහ ලුතිතන් කර්නල් එච්එම්එස්ඒ පද්මසිරි යන ජ්‍යෙෂ්ඨ නිලධාරින් විශ්‍රාම ගැනීමට සමගාමීව රෙජිමේන්තු මධ්‍යස්ථානය වෙතින් 2025 ජුනි මස 22 දින නිලධාරි නිවස්නයේදි සම්ප්‍රදායික සමුගැනීමේ සාදයක් පවත්වන ලදි.

ඒ සඳහා ශ්‍රී ලංකා යුද්ධ හමුදා පොලිස් හේවා බලකායේ කර්නල් සේනාවිධායක මේජර් ජෙනරාල් යූ එල් ජේ එස් පෙරේරා ආර්එස්පී යූඑස්පී එන්පීඑස් සහ මධ්‍යස්ථාන සේනාවිධායක බ්‍රිගේඩියර් එම්එම්එම්පී මහේෂ් කුමාර ජ්‍යෙෂ්ඨ නිලධාරින් ඇතුලු අනෙකුත් ශ්‍රීලයුපොහේබ නිලධාරීන් සහ ඔවුන්ගේ පවුල් හි සාමාජිකයින් මේ සඳහා සහභාගි වන ලදී.

## නික්ම යන කර්නල් සේනාවිධායක වෙත බළලත් නිලධාරි හා සැරයන් නිවස්නයෙන් හරසර





ශ්‍රී ලංකා යුද්ධ හමුදාව වෙනුවෙන් වසර 35 ක ගෞරවනීය සේවයක් ඉටුකර විශ්‍රාම ගනු ලබන රෙජිමේන්තු කර්නල් සේනාවිධායක මේජර් ජෙනරාල් යුඑල්ජේඑස් පෙරේරා ආර්එස්පී යුඑස්පී එන්පීඑස් පීඑස්සී ජ්‍යෙෂ්ඨ නිලධාරි වෙනුවෙන් සම්ප්‍රදායිකව පවත්වනු ලබන සාදය 2025.06.30 දින රෙජිමේන්තු මධ්‍යස්ථාන බළලත් නිලධාරි සහ සැරයන් නිවස්නයේදි පවත්වන ලදී. එම අවස්ථාව සිහිගන්වමින් රෙජිමේන්තු සැරයන් මේජර් විසින් සමරු ඵලකයක් කර්නල් සේනාවිධායක වෙත පිළිගන්වන ලදී.

## නව ජල පිරිපහදුව





ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ යුද සේවා ලේකම් මෙන්ම ශ්‍රී ලංකා යුද්ධ හමුදා පොලිස් හේවා බලකායේ කර්නල් සේනාවිධායක මේජර් ජෙනරාල් යුඑල්ජේඑස් පෙරේරා ආර්එස්පී යුඑස්පී එන්පීඑස් පීඑස්සී ජ්‍යෙෂ්ඨ නිලධාරිගේ මග පෙන්වීම සහ පූර්ණ අධීක්ෂණය යටතේ ශ්‍රී ලංකා යුද්ධ හමුදා සුභ සාධක අරමුදල වෙතින් ලබා දෙන ලද මූල්‍යමය පරිත්‍යාග යටතේ ජල පිරිපහදු මධ්‍යස්ථානය 2025 ජූලි මස 03 වන දින සියලු නිලයින්ගේ ප්‍රයෝජනය සඳහා විවෘත කරන ලදි.



## 1 ශ්‍රීලයුපොහේබ වෙතින් සංවිධානය කරන ලද දේශණය







විනයාරක්ෂක අධ්‍යක්ෂක මණ්ඩලයේ මගපෙන්වීම යටතේ ශ්‍රී ලංකා යුද්ධ හමුදා සමාජිකයින්ගේ දැනුම සහ ආකල්ප වැඩි දියුණු කිරීමේ අරමුණින් 2025 මාර්තු 11 දින 1 වන ශ්‍රී ලංකා යුද්ධ හමුදා පොලිස් හේවා බලකාය විසින් මෙම දේශණය සංවිධානය කරන ලදි. මෙහිදි, ආරක්ෂක සේනා මූලස්ථානය (බටහිර) හි රියදුරු රාජකාරියේ නියුතු සෙසු නිලයින් සඳහා රථ වාහන කළමනාකරණය සහ ශ්‍රීලයුසේබ ක්‍රියා පිළිවෙත පිළිබඳව දැනුවත් කරමින් මෙම දේශනය සිදුකරන ලදී.

## අභිමානයෙන් සැමරූ 34 වන ඒකක දින සංවත්සරය

2 වන රෙජිමේන්තුව ශ්‍රී ලංකා යුද්ධ හමුදා පොලිස් හේවා බලකායේ 34 වන සංවත්සරයට සමගාමීව වැඩසටහන් මාලාවක් ඒකකය වෙතින් පවත්වන ලදි. එහිදි, 2025.04.01 වන දින අණදෙන නිලධාරි වෙත කඳවුරු මුරයක් සම්මාන පෙළපාලියක් පිරිනැමීම හා ඒකක සංවත්සර දිනය සනිටුහන් කිරීම සඳහා ඒකක අණදෙන නිලධාරි විසින් පැලයක් රෝපනය කරන ලදී.

එදින, සියලු නිල දිවා භෝජන සංග්‍රහයක් හා අණදෙන නිලධාරි විසින් සියලු නිලයින් ඇමතීම සිදුකරනු ලැබීය. අවසානයේ සියලු නිලයින්ගේ සුහදත්වය වර්ධනය කිරීම උදෙසා සංගීත රාත්‍රියක් පවත්වා සංවත්සර වැඩසටහන් මාලාව නිමාවට පත්කරන ලදි.









## බැති සිතින් සැමරූ පොසොන් පොහොය









අනුබුදු මිහිදු මහ රහතන් වහන්සේගේ ලංකාගමනය සමරනු ලබන පොසොන් පුන් පොහෝ දිනයට සමගාමීව 2 වන ශ්‍රී ලංකා යුද්ධ හමුදා පොලිස් හේවා බලකාය වෙතින් සුමදුර බැති ගී සරණියක් සහ දන්සලක් ගිරිතලේ වැව් ඉස්මත්තේදී 2025 ජුනි මස 10 වන පවත්වන ලදී.

මෙම උත්සවය සඳහා කර්නල් සේනාවිධායක ඇතුලු ශ්‍රීලයුපොහේබ නිලධාරින් සහ සෙසුනිලයින් මෙන්ම ප්‍රදේශයේ සිවිල් ජනතාවද සහභාගිවන ලදී. මෙම බැති ගී සරණිය සඳහා දායකත්වය ලබා දෙන ලද දුවා දරුවන් සඳහා ද ත්‍යාග ප්‍රධානය කරන ලදී.

# 3 වන ශ්‍රී ලංකා යුද්ධ හමුදා පොලිස් සේවා බළකාය 34 වන සංවත්සරය සමරයි

3 වන රෙජිමේන්තුව ශ්‍රී ලංකා යුද්ධ හමුදා පොලිස් සේවා බලකායේ 34 වන සංවත්සරයට සමගාමීව වැඩසටහන් මාලාවක් ඒකකය වෙතින් පවත්වන ලදි. එහිදි, 2025 මාර්තු මස 01 වන දින අණදෙන නිලධාරි වෙත කඳවුරු මුරයක් සම්මාන පෙළපාලියක් පිරිනැමීම හා ඒකක සංවත්සර දිනය සනිටුහන් කිරීම සඳහා ඒකක අණදෙන නිලධාරි විසින් පැලයක් රෝපනය කරන ලදී.

එදින, සියලු නිල දිවා භෝජන සංග්‍රහයක් හා අණදෙන නිලධාරි විසින් සියලු නිලයින් ඇමතීම සිදුකරනු ලැබීය. අවසානයේ සියලු නිලයින්ගේ සුහදත්වය වර්ධනය කිරීම උදෙසා සංගීත රාත්‍රියක් පවත්වා සංවත්සර වැඩසටහන් මාලාව නිමාවට පත්කරන ලදි.












## 5 ශ්‍රීලයුපොහේබ ඒකකය නව ස්ථානයකට










කිලිනොච්චිය ප්‍රදේශයේ ස්ථාපිත කර තිබූ 5 වන ශ්‍රී ලංකා යුද්ධ හමුදා පොලිස් සේවා බලකාය ශ්‍රී ලංකා යුද්ධ හමුදාව යථායෝග්‍ය ප්‍රමානිකරණය යටතේ කිලිනොච්චි ප්‍රදේශයෙන් ඉවත්ව හෝමාගම හබරකඩ බතලවත්ත ප්‍රදේශයේ 2025 ජුලි මස 02 වන දින නැවත ස්ථාපනය කරන ලදී. ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ යුධ සේවා ලේකම් මෙන්ම ශ්‍රී ලංකා යුද්ධ හමුදා පොලිස් සේවා බලකායේ කර්නල් සේනාවිධායක මේජර් ජෙනරාල් යුඑල්ජේඑස් පෙරේරා ආර්එස්පී යුඑස්පී එන්පීඑස් පීඑස්සී ජ්‍යෙෂ්ඨ නිලධාරිගේ ප්‍රධානවත්වයෙන් 5 වන ශ්‍රී ලංකා යුද්ධ හමුදා පොලිස් සේවා බලකායේ නාම පුවරුව සහ සමරු ඵලකය නිරාවරණය කරමින් කඳවුරේ රාජකාරි ආරම්භය සනිටුහන් කරන ලදී. මෙම අවස්ථාව සඳහා හකාස අණසක ආඥාපති ආරක්ෂක සේනා මූලස්ථානය (මධ්‍යම) මේජර් ජෙනරාල් ආර්ඩී සලේ එන්ඩීසී ජ්‍යෙෂ්ඨ නිලධාරි, ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ විනයාරක්ෂකාධිපති මේජර් ජෙනරාල් ඒඑම්ආර් අබේසිංහ එන්ඩීසී සහ මධ්‍යස්ථාන සේනාවිධායක බ්‍රිගේඩියර් එම්එම්එම්පී මහේෂ් කුමාර ඇතුලු නිලධාරින් සහ සෙසුනිලයින් සහභාගී වූහ.

## ජනාධිපති සම්මාණ මුරය ශ්‍රීලයුපොහේබ වෙත භාරදීම



ශ්‍රී ලංකා යුද්ධ හමුදාව නියෝජනය කරමින් ජනාධිපති සම්මාන මුර රාජකාරිය ශ්‍රී ලංකා යුද්ධ හමුදා පොලිස් සේවා බලකාය වෙත 2025 ජුලි මස 01 දින ශ්‍රී ලංකා ගුවන් හමුදාව වෙතින් භාර දෙන ලදී.

මෙම උත්සවය සඳහා 5 වන ශ්‍රී ලංකා යුද්ධ හමුදා පොලිස් සේවා බලකායේ අණදෙන නිලධාරි ලුතිතන් කර්නල් බීජීඑස්එම් බෝගහවෙල යුඑස්පී පීඑස්සී ජ්‍යෙෂ්ඨ නිලධාරි සහ ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ ජ්‍යෙෂ්ඨ නිලධාරින් පිරිසක් සහභාගි වන ලදි.



## විමර්ශණ රපෝර්තු සැකසීමේ පාඨමාලාව - 2025 අධියර 1



ශ්‍රී ලංකා යුද්ධ හමුදා පොලිස් හේවා බලකා පුහුණු පාසල වෙතින් වාර්ෂික පුහුණු සැලැස්මට අනුව ආරම්භ කරන ලද විමර්ෂණ රපෝර්තු සැකසීමේ පාඨමාලාව 2025 පෙබරවාරි මස 17 දින ආරම්භ කරන ලදී. එහි ආරම්භක දේශනය ප්‍රධාන උපදේශක මේජර් එච්එම්සීසී සූරියබණ්ඩාර යුඑස්පී යන ජ්‍යෂ්ඨ නිලධාරි විසින් සිදු කළහ. එම පාඨමාලාව හැදෑරීම සඳහා ශ්‍රීලයුපොහේබ ඒකක/නිඅහපි වෙතින් නිලධාරින් 02 ක් සහ සෙසු නිලයින් 29 දෙනෙකු සහභාගිවිය.

## සේනාවිධායක තනතුරෙන් නික්මයාම







ශ්‍රී ලංකා යුද්ධ හමුදා පොලිස් හේවා බලකා පුහුණු පාසලේ 16 වන සේනාවිධායක වශයෙන් රාජකාරි කරන ලද බ්‍රිගේඩියර් ජේඑස් මුණසිංහ යන ජ්‍යෂ්ඨ නිලධාරි 2025 මාර්තු මස 09 වන දින ධූරයෙන් නික්ම යන ලදී. එම අවස්ථාව සම්ප්‍රධායානුකූලව සම්මාන මුරයක්, සම්මාන පෙළපාලියක් ඇතුලුව අනෙකුත් වැඩසටහන් වලින් සමන්විතවිය.

## නව සේනාවිධායක තනතුරේ රාජකාරි ආරම්භ කිරිම





ශ්‍රී ලංකා යුද්ධ හමුදා පොලිස් පුහුණු පාසලේ 16 වන සේනාවිධායක වශයෙන් කර්නල් අයි ආර් හන්තානෙආරච්චි ජ්‍යෂ්ඨ නිලධාරි 2025 මාර්තු මස 14 දිනට යෙදුන සුභ මොහොතින් ආගමික වතාවත් වලට මුල්තැන දෙමින් සිය තනතුරේ රාජකාරි ආරම්භ කරන ලදී. එම අවස්ථාව යුද්ධ හමුදා සාම්ප්‍රදායානුකූල අංගයන්ගෙන් සමන්විතවිය.

## විනයාරක්ෂක පාඨමාලාව අංක 84 විසිරයාමේ උත්සවය








ශ්‍රී ලංකා යුද්ධ හමුදා පොලිස් හේවා බලකාය වෙත ඉදුරාම බඳවා ගන්නා ලද විනයාරක්ෂක සෙබලුන් 36 දෙනෙකුගෙන් යුත් විනයාරක්ෂක පාඨමාලාව අංක 84 විසිරයාමේ පෙළපාළිය 2025 ජුනි 26 වන දින පුහුණු පාසලේදි පවත්වන ලදී. මෙම අවස්ථාව සඳහා කර්නල් සේනාවිධායක මේජර් ජෙනරාල් යුඑල්ජේඑස් පෙරේරා ආර්එස්පී යුඑස්පී එන්ඩීඑස් පීඑස්සී ජ්‍යෙෂ්ඨ නිලධාරි ඇතුලු නිලධාරින්, සෙසු නිලයින් සහ ආධුනික සෙබලුන්ගේ ලගම ඥාතින් සහභාගිවිය. එහිදි සෑම අතින්ම අතිශූර සෙබලා ලෙස සෙ/682300 සාසෙ පියතිස්ස වයිපීපීඑස් ද, හා දක්ෂතම වෙඩි තබන්නා ලෙස සෙ/682327 සාසෙ සඳරුවන් ඩබ්ලිව්එම් හට හිමි ශූරතාවයන් කර්නල් සේනාවිධායක විසින් පිරිනමන ලදී.

## විවිඒ අණදෙන නිලධාරි තනතුරේ රාජකරි අත්හැරීම සහ රාජකාරි ආරම්භ කිරිම




විශේෂ විමර්ෂණ ඒකකයේ 13 වන අණදෙන නිලධාරි වශයෙන් රාජකාරි කරන ලද කර්නල් ඊඑම්අයි ඒකනායක ජ්‍යෙෂ්ඨ නිලධාරි 2025 පෙබරවාරි මස 24 දින එම තනතුරේ රාජකාරි අත්හරින ලදි. එමෙන්ම, නව අණදෙන නිලධාරි වශයෙන් කර්නල් එච්ජ්එච්සී අල්විස් යුඑස්පී ජ්‍යෙෂ්ඨ නිලධාරි 2025 පෙබරවාරි මස 25 දින සිය තනතුරෙහි රාජකාරි ආරම්භ කරන ලදී.

එම අවස්ථාවන් යුද්ධ හමුදා සම්ප්‍රදායානුකූල සම්මානෙ මුරයක්, සම්මාන පෙළපාලියක් ඇතුලු අනෙකුත් වැඩසටහන් වලින් සමන්විත විය.




## විශේෂ විමර්ශණ ඒකකයේ 27 වන සංවත්සරය










ශ්‍රී ලංකා යුද්ධ හමුදා පොලිස් හේවා බලකායේ විශේෂ විමර්ශන ඒකකයේ 27 වන සංවත්සරය 2025 ජුනි මස 06 වන දින අණදෙන නිලධාරි කර්නල් එච්ඒඑච්සී අල්විස් යූඑස්පී ජ්‍යෙෂ්ඨ නිලධාරිගේ ප්‍රධානත්වයෙන් යුතුව ආගමික වතාවන්ට මුල්තැන දෙමින් පවත්වන ලදී.

එම වැඩසටහන කඳවුරු මුරයක් සහ අලංකාර සම්මාන පෙළපාලියක් ඇතුළු අනෙකුත් වැඩසටහන් වලින් සමන්විත විය.

## නවතමයෙන් සකස්කරන ලද පැසි පන්දු ක්‍රීඩා පිටියේ පැවැත්වූ තරඟාවලිය

නවීකරනය කරන ලද රෙම ශ්‍රීලයුපොහේබ පැසි පන්දු ක්‍රීඩාපිටිය විවෘත කිරීමට සමගාමීව සුහද පැසිපන්දු තරඟයක් 2025 ජුලි මස 01 වන දින පැවැත්වීය. මෙම අවස්ථාව සඳහා කර්නල් සේනවිධායක මේජර් ජෙනරාල් යූඑල්ජේඑස් පෙරේරා ආර්එස්පී යූඑස්පී එන්ඩීඑස් පීඑස්සී ජ්‍යෙෂ්ඨ නිලධාරි ඇතුලු අනෙකුත් ජ්‍යෙෂ්ඨ නිලධාරින් සහ සෙසුනිලයින් සහභාගී වන ලදී.








## කාන්තා සෙබලියන් වෙනුවෙන් පවත්වන ලද මානසික සුවතා හා අභිප්‍රේරණ වැඩසටහන



යුද්ධ හමුදා පොලිස් හේවා බලකා සේවා වනිතා ශාඛාවේ සභාපති තුමිය ඉරේෂා පෙරේරා මැතිණියගේ සංකල්පයක් මත මෙම රෙජිමේන්තුව යටතේ රාජකාරි කරනු ලබන කාන්තා නිලධාරිනියන්/ සෙබලියන්ගේ චිත්ත ධෛර්ය හා මානසික සුවතාවය වර්ධනය කිරීමේ අරමුණින් 2025 පෙබරවාරි මස 14 දින අභිප්‍රේරණ වැඩසටහනක් පවත්වන ලදී.

එම අභිප්‍රේරණ වැඩසටහන ප්‍රවීන මනෝවිද්‍යා දේශිකා භාග්‍ය දේශප්‍රිය මැතිණියගේ සහභාගිතවයෙන් පැවැත්විය. මේ සදහා සේවා වනිතා ශාඛා සාභාපතිතුමිය ඇතුලු සාමාජිකාවන් හා කාන්තා නිලධාරිනියන්/ සෙබලියන් 75 දෙනෙකුගේ සහභාගිවිය. එහිදී, කාන්තා සෙබලියන් වෙනුවෙන් සංගීතමය රසාස්වාද වැඩසටහනක් හා කුසපත් ඇදීමෙන් තිළිණ ලබා දීමද සිදුකරන ලදී.





## යුහ සේවා වනිතා ඒකකයෙන් පරිත්‍යාගයක්

2025 පෙබරවාරි මස 05 දින යුද හමුදා සේවා වනිතා ඒකකයේ සභාපතිනිය විසින් උපතේ සිටන ආබාධිතව සිටින සෙ/678853 සැරයන් අබේසිංහ එච්එම්අයිඑල් යන ජ්‍යොකොනොනිගේ දියණියට ප්‍රතිකාර කිරීම සඳහා නෙබියුලයිසර් යන්ත්‍රයක් ප්‍රධානය කරන ලදී.



## අපේක්ෂා රෝහල වෙත සේවා වනිතාවන්ගෙන් උපකාරයක්





2025 ජනවාරි 04 වන දින මහරගම අපේක්ෂා රෝහලේදී 5 ශ්‍රීලයුපොහේබ ඒකක විසින් පරිත්‍යාගමය වැඩසටහනක් පවත්වන ලදී. මෙම වැඩසටහනට පූජ්‍ය ලිඳගල ආනන්ද හිමියන්ගේ අනුග්‍රහයෙන් රුපියල් 490,000.00 ක් පමණ වටිනා ද්‍රව්‍යමය පරිත්‍යාග ඇතුළත් වූ අතර, පිළිකා රෝගීන් සඳහා මූල්‍යමය දායකත්වයක් ලෙස රුපියල් 300,000.00 ක් පරිත්‍යාග කරන ලදී.

මෙම පරිත්‍යාග වැඩසටහනෙන් පසු ශ්‍රීලයුපොහේබහි රාජකාරි කරනු ලබන ගර්භනී කාන්තාවන් සඳහා පෝෂ්‍යදායී ආහාර වේලක් සහ අත්‍යවශ්‍ය පෝෂණ අතිරේක මලු ප්‍රධානය කලහ.







## ජාත්‍යන්තර කාන්තා දින සැමරුම

ජාත්‍යන්තර කාන්තා දිනය සැමරීමට සමගාමීව සේවා වනිතා ශාඛාව වෙතින් විශේෂ වැඩසටහනක් 2025 මාර්තු මස 07 වන දින සංවිධානය කරන ලදී. මෙම උත්සවය ශ්‍රී ලංකා යුද්ධ හමුදා පොලිස් හේවා බලකායේ සේවා වනිතා ශාඛාවේ සභාපතිනි ඉරේෂා පෙරේරා මහත්මියගේ ප්‍රධානත්වයෙන් පැවැත්විණි. එහිදි **Forever (Pvt) Ltd** හි නිර්මාතෘ සහ සභාපතිනි චාන්දනී බණ්ඩාර මහත්මිය විසින් රූපලාවන්‍ය සහ සංස්කෘතික දැනුවත්භාවය පිළිබඳ වැඩමුළුවක් පැවැත්විය.

මෙම වැඩසටහන වර්ණවත් කිරීම සඳහා ශ්‍රී ලංකා හමුදා නර්තන කණ්ඩායමේ සහ ලතින් සහ බෝල්රූම් නර්තන ශිල්පීන් වන භාරත ද සිල්වා මහතා සහ කෙසී ලාරා මහත්මියගේ විචිත්‍රවත් රංගනයන් ඉදිරිපත් කරන ලදී. එම අවස්ථාවට සේවා වනිතා ශාඛාවේ සාමාජිකාවන්, කාන්තා නිලධාරිණීන් සහ කාන්තා සෙබළියන් සහභාගි වූහ.








## ශ්‍රී ලංකා යුද්ධ හමුදා සේවාවනිතා ශාඛාව හා විවිඒ එක්ව සංවිධානය කරන ලද රුධිර පරිත්‍යාග වැඩසටහන

ශ්‍රී ලංකා යුද්ධ හමුදා පොලිස් හේවා බලකායේ සේවා වනිතා ශාඛාවේ මූලිකත්වයෙන් විශේෂ විමර්ශන ඒකකය විසින් සංවිධානය කරන ලද රුධිර පරිත්‍යාග කිරීමේ වැඩසටහනක් 2025 මාර්තු 18 වන දින රෙජිමේන්තු මධ්‍යස්ථානයේදී පවත්වන ලදී. මෙම වැඩසටහනේදි නිලධාරීන් සහ සෙසු නිලයන් ඇතුළු පරිත්‍යාගශීලීන් 118 ක් රුධිරය පරිත්‍යාග කිරීම සිදුකරන ලදී. එහිදි සෑම රුධිර පරිත්‍යාගශීලියෙකුටම පලතුරු පැළයක් ප්‍රදානය කිරිමක් ද විශේෂ විමර්ශන ඒකකය මගින් සිදු කලහ.

මෙම අවස්ථාව සඳහා සේවා වනිතා ශාඛාවේ ගරු සභාපතිනි ඉරේෂා පෙරේරා මහත්මිය, ශ්‍රී ලංකා යුද හමුදා විනයාරක්ෂකාධිපති බ්‍රිගේඩියර් ආර්ඩී සලේ එන්ඩිසි, මධ්‍යස්ථාන සේනාවිධායක බ්‍රිගේඩියර් එම්එම්එම්පී මහේෂ් කුමාර ඇතුලු නිලධාරීන් සහ සෙසු නිලයින් රැසක් සහභාගී වූහ. එහිදි ජාතික රුධිර පාරවිලයන මධ්‍යස්ථානය සහ යුද්ධ හමුදා රෝහල වෙතින් වෛද්‍ය සේවාවන් ලබා දෙන ලදී.




## සේවා වනිතා කාර්යාලය නිල වශයෙන් විවෘත කිරීම




2025 අප්‍රේල් මස 27 වන දින රෙජිමේන්තු මූලස්ථානයේදී සේවා වනිතා ශාඛාවේ සභාපතිනි ඉරේෂා පෙරේරා මහත්මිය විසින් සේවා වනිතා නව කාර්යාලය නිල වශයෙන් විවෘත කරන ලදී.

## 4 ශ්‍රීලයුපොහේබ ඒකක සේවා වනිතාවන් විසින් සංවිධානය කරන ලද ශාන්ත ලූක් වැඩිහිටි නිවාස සංචාරය

2025 මැයි 31 වන දින ශ්‍රී ලංකා හමුදා පොලිස් හේවා බලකායේ සේවා වනිතා ශාඛාව 4 වන ශ්‍රී ලංකා යුද්ධ හමුදා පොලිස් හේවා බලකාය සමඟ සහයෝගයෙන් යුතුව පුත්තූර් හි ශාන්ත ලූක් වැඩිහිටි නිවාසය වෙත සංචාරයක් සිදුකරන ලදී. මෙම සංචාරයේදි වැඩිහිටියන් සඳහා අවැසි රෝද පුටු හා නව ඇඳ ඇතිරිලි බෙදාදීමක් සිදුකල අතර ඔවුන් සඳහා කෙටි ආහාර වේලක් ලබාදීමක් ද සිදුකරන ලදී.

එම අවස්ථාව සදහා සේවා වනිතා ශාඛාවේ ගරු සභාපතිතුමිය හා සේවා වනිතා ශාඛාවේ සාමාජිකාවන් මෙන්ම ශ්‍රී ලංකා යුද්ධ හමුදා පොලිස් හේවා බලකායේ කර්නල් සේනාවිධායක ඇතුලු නිලධාරි සහා සෙසුනිලයින් සහභාගි විය.






## ශ්‍රී ලංකා යුද්ධ හමුදා පොලිස් හේවා බලකා සේවා වනිතා ශාඛාව හා 7 ශ්‍රීලයුපොහේබ ඒක්ව අඩු ආදායම්ලාභී නිවැසියන්ට නිවාසයක් ඉදිකරදීම



හපුතලේ ප්‍රාදේශිය ලේකම් බල ප්‍රදේශයේ පදිංචි අඩු ආදායම්ලාභී පවුලක් වෙත අංග සම්පූර්ණ නව නිවසක් ඉදි කිරිමේ කටයුතු 7 ශ්‍රීලයුපොහේබ ඒකකයේ මූලිකත්වයෙන් සිදුකරන ලදි.

එම නව නිවස පවුලේ සාමාජිකයන් වෙත චාරිත්‍රානුකූලව ලබාදීමේ උත්සවය කර්නල් සේනාවිධායක මේජර් ජෙනරාල් යුඑල්ජේඑස් පෙරේරා ආර්එස්පී යුඑස්පී එන්ඩීඑස් පීඑස්සී ජ්‍යෙෂ්ඨ නිලධාරි හා සේවා වනිතා සභාපති තුමිය වන ඉරේෂා පෙරේරා මහත්මියගේ ප්‍රධානත්වයෙන් 2025 ජුනි මස 25 වන දින පවත්වන ලදි.






## සේවා වනිතා ශාඛාව මුලතිව් හි සිදුකල ළමා නිවාස සංචාරය

ශ්‍රී ලංකා යුද්ධ හමුදා පොලිස් හේවා බලකා සේවා වනිතා ශාඛාව දැයේ දරුවන් වෙනුවෙන් සිදුකරනු ලබන සුභසාධන වැඩසටහන් අතර නිලධාරි අණදෙන හඵපිරිස් (මුලතිව්) හි සහයෝගයෙන් යුතුව 2025 මැයි මස 30 වන දින පුදුකුඩිඉරිප්පු හි පිහිටි ළමා නිවාසයේ සංචාර කිරිමේ වැඩසටහනක් සංවිධානය කරන ලදී.

එම වැඩසටහනට සමගාමීව ළමා නිවාසයේ දරුවන් වෙනුවෙන් පෝෂ්‍යදායී දිවා ආහාරයක් ලබා දුන් අතර දරුවන්ගේ දෛනික අවශ්‍යතා සඳහා අත්‍යවශ්‍ය ද්‍රව්‍ය පරිත්‍යාග කිරිම සිදුකලහ. එම අවස්ථාව සඳහා සේවා වනිතා ශාඛාවේ ගරු සභාපතිතුමිය හා සේවා වනිතා ශාඛාවේ සාමාජිකාවන් මෙන්ම ශ්‍රී ලංකා යුද්ධ හමුදා පොලිස් හේවා බලකායේ කර්නල් සේනාවිධායක ඇතුලු නිලධාරි සහා සෙසුනිලයින් සහභාගි විය.












## යුද්ධ හමුදා සේවා වනිතා ඒකකයේ සභාපතිනි බහුකාර්ය සුහසාධන සංකීර්ණය සඳහා මුල්ගල තබයි

2025 ජුනි 22 වන දින සුභ මොහොතින් යුද්ධ හමුදා සේවා වනිතා ඒකකයේ සභාපතිනි ස්වෙන්ද්‍රිනි දිසානායක මැතිණිය රෙජිමේන්තු මූලස්ථානයෙහි ස්ථාපිත කිරීමට යෝජිත බහුකාර්ය සුභසාධන සංකීර්ණය සඳහා මුල්ගල් තැබීම සිදු කරන ලදී. ඊට සමගාමීව විශේෂ අවශ්‍යතා ඇති අයවලුන් වෙනුවෙන් රෝද පුටු පරිත්‍යාග කිරීමක් නිලධාරි නිවාස්නයේදි සිදුකල අතර, සිවිල් සේවක මහත්ම/මහත්මීන් සඳහා තෑගි වව්චර 58 ක් පරිත්‍යාග කිරීමද සිදුකරන ලදී.





## සේවා වනිතා ශාඛාව වාර්ෂික මහා සභා රැස්වීම

ශ්‍රී ලංකා හමුදා පොලිස් සේවා බලකායේ සේවා වනිතා ශාඛාවේ වාර්ෂික මහා සභා රැස්වීම 2025 ජුනි 22 වන දින පොල්හේන්ගොඩ රෙජිමේන්තු මූලස්ථානයේදී පැවැත්විණි. එම වාර්ෂික මහා සභා රැස්වීමට සමගාමීව මානව සම්පත් අභිප්‍රේරණය සහ නායකත්ව සංවර්ධනය පිළිබඳ උපදේශක සුරනි වෙත්තසිංහ මහත්මිය විසින් වැඩමුළුවක් පවත්වන ලදී.

සේවා වනිතා ශාඛාවේ විශේෂ සුභ සාධන වැඩසටහනක් වශයෙන් රිය අනතුරක් හේතුවෙන් ආබාධිත සෙ/680942 ලා/කෝ සමරසිංහ කේඑම්ඩීඩබ්ලිව්එස් යන සෙනී හට ශ්‍රියාල් ද සිල්වා මහතා සහ නිලක්ෂි ද සිල්වා මහත්මිය විසින් නිවසක් ඉදිකර ගැනීම සඳහා රුපියල් මිලියනයක මූල්‍යමය පරිත්‍යාගයක් සිදුකිරීම මෙහි සුවිශේෂි කටයුත්තක් විය. එම කටයුතු සඳහා කර්නල් සේනාවිධායක, සේවා වනිතා සභාපති තුමිය, සේවා වනිතා ශාඛාවේ හිටපු සභාපති තුමියන් මෙන්ම, සේවා වනිතා ශාකාවේ වත්මන් සාමාජිකාවන් සහභාගිවිය.







# නව තනතුරු



ආසේමු(ව) හි බ්‍රිගේඩියර් පාලන සහ හකාස ලෙස බ්‍රිගේඩියර් ජේඑස් මුණසිංහ යන ජ්‍යෙෂ්ඨ නිලධාරි 2025.03.29 දින සුභ මොහොතින් රාජකාරි ආරම්භ කරන ලදි.



ආසේමු(ම) හි බ්‍රිගේඩියර් ව්‍යාපෘති භාර නිලධාරි ලෙස බ්‍රිගේඩියර් ඩිඩිඩි සේරසිංහ යුඑස්පී යන ජ්‍යෙෂ්ඨ නිලධාරි 2025.03.11 දින සුභ මොහොතින් රාජකාරි ආරම්භ කරන ලදි.



රෙම ශ්‍රීලයුපොහේබ මාණ්ඩලික නිලධාරි 1 (පාලන) ලෙස ලුතිතන් කර්නල් පීජේටීඩී ජාසිංහ යන ජ්‍යෙෂ්ඨ නිලධාරි 2025.03.12 දින සුභ මොහොතින් රාජකාරි ආරම්භ කරන ලදි.



රෙම ශ්‍රීලයුපොහේබ මාණ්ඩලික නිලධාරි 1 (හකාස) ලෙස ලුතිතන් කර්නල් අයිඑම්කේ සුද්දාගල එල්එස්සී යන ජ්‍යෙෂ්ඨ නිලධාරි 2025.02.27 දින සුභ මොහොතින් රාජකාරි ආරම්භ කරන ලදි.



1 ශ්‍රීලයුපොහේබ දෙවන අණදෙන නිලධාරි ලෙස මේජර් කේටී රන්දික යුඑස්පී එල්එස්සී යන ජ්‍යෙෂ්ඨ නිලධාරි 2025.03.04 දින සුභ මොහොතින් රාජකාරි ආරම්භ කරන ලදි.



රෙම ශ්‍රීලයුපොහේබ විධායක අධිකාරි ලෙස මේජර් ආර්පීඩීපී රාජපක්ෂ එල්එස්සී යන ජ්‍යෙෂ්ඨ නිලධාරි 2025.02.13 දින සුභ මොහොතින් රාජකාරි ආරම්භ කරන ලදි.



රෙම ශ්‍රීලයුපොහේබ මානි 11(හකාස) ලෙස මේජර් ඊඑස්එච්ටී ආරියසේන යන ජ්‍යෙෂ්ඨ නිලධාරිනි 2025.03.27 දින සුභ මොහොතින් රාජකාරි ආරම්භ කරන ලදි.



රෙම ශ්‍රීලයුපොහේබ මානි 11(පාලන) ලෙස මේජර් ඒජ් වික්‍රමරත්න එල්එස්සී යන ජ්‍යෙෂ්ඨ නිලධාරි 2025.01.07 දින සුභ මොහොතින් රාජකාරි ආරම්භ කරන ලදි.



රෙම ශ්‍රීලයුපොහේබ මානි 11(ගිණුම්) ලෙස මේජර් කේආර්එච්එස් සිරිවන්ත යන ජ්‍යෙෂ්ඨ නිලධාරිණි 2025.05.20 දින සුභ මොහොතින් රාජකාරි ආරම්භ කරන ලදි.



රෙම ශ්‍රීලයුපොහේබ ප්‍රමානි 111 ලෙස කපිතන් එන්එච්ටී රැක්ෂාන් යන නිලධාරි 2025.04.04 දින සුභ මොහොතින් රාජකාරි ආරම්භ කරන ලදි.



විවිජ් රෙසැමේ ලෙස බනි 1 කේආර්පීඩී වීරසිංහ යුඑස්පී යන බලලත් නිලධාරි 2025.05.06 දින සුභ මොහොතින් රාජකාරි ආරම්භ කරන ලදි.



රෙම ශ්‍රීලයුපොහේබ සරඹ උපදේශක ලෙස බනි 1 එල්ආර්එම්ආර් කැලුම්සිරි යුඑස්පී යන බලලත් නිලධාරි 2025.05.06 දින සුභ මොහොතින් රාජකාරි ආරම්භ කරන ලදි.

# සුභ මංගලම්



මේජර් යූජ්යූසී උඩගෙආරච්චි ජ්‍යෙෂ්ඨ නිලධාරි 2025-03-21 දිනට යෙදුනු සුභ මොහොතින් අනූෂා මෙනවිය සමගින් අතිනත ගන්නා ලදි



මා/සැ ප්‍රසාද් කුමාර එන්එච්ආර් ජ්‍යොකොනොනි 2025-01-30 දිනට යෙදුනු සුභ මොහොතින් නදීකා මෙනවිය සමගින් අතිනත ගන්නා ලදි



සැරයන් දිසානායක ඩීඑම්එස්ඩී ජ්‍යොකොනොනි 2025-03-28 දිනට යෙදුනු සුභ මොහොතින් ගයානි මෙනවිය සමගින් අතිනත ගන්නා ලදි



කෝප්‍රල් චන්ද්‍රසිරි බිබිසිඩී කොනොනි 2025-05-28 දිනට යෙදුනු සුභ මොහොතින් අශානි මෙනවිය සමගින් අතිනත ගන්නා ලදි



## මතක සුවඳ පොත පිළිගන්වමින්

අමරණීය මතකයන් ඉතිරි කරමින් වර්ෂ 1997 ජනවාරි මස 02 වන දින තිරුණල්වේලිහීදි ශ්‍රී ලංකා ද්වීපය වෙනුවෙන් අවසන් හුස්ම වාතලයට මුසු කරන ලද, සෙ/58860 කෝප්‍රල් ඉරේෂා නිල්මිණි වීරවරිය පිළිබඳව සාමවිනිසුරු සී ද ඉසෙඩ් එඩව්ඩ් මහතා විසින් (මියගිය වීරවරියගේ පියා) සකස් කරන ලද මතක සුවඳ නම් ආවර්ජනීය පොත ශ්‍රී ලංකා යුද්ධ හමුදාධිපති ලුතිතන් ජෙනරාල් බීකේජීඑම්එල් රොඩ්‍රිගෝ ආර්එස්පී සීටීඑෆ්-එන්ඩීයු පීඑස්සී අයිජී තුමන් වෙත කෝට්ටේ ශාන්ත තෝමස් දේව් මැදුරේදි පිළිගන්වන ලදී.

## සූර්ය මංගල්‍ය - 2025

ශ්‍රී ලංකා හමුදා පොලිස් හේවා බලකා සේවා වනිතා ශාඛාව 2025 අප්‍රේල් 06 වන දින පනාගොඩ ශ්‍රී ලංකා සංඥා බලකා ක්‍රීඩා පිටියේදී සිංහල අලුත් අවුරුද්ද නිමිති කොටගෙන බක්මහා උළෙලක් පැවැත්විය. ශ්‍රී ලංකා යුද්ධ හමුදා පොලිස් හේවා බලකායේ නිලධාරි සෙසුනිලයින් මෙන්ම ඔවුන්ගේ පවුල් වල සාමාජිකයින් සඳහා ජන ක්‍රීඩා රැසක් සමගින් විචිත්‍රවත් සාම්ප්‍රදායික අලුත් අවුරුදු සැමරීමේ උත්සවයක් සමරන ලදි. එම අවස්ථාව සඳහා ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ යුද සේවා ලේකම් සහ ශ්‍රී ලංකා යුද්ධ හමුදා පොලිස් හේවා බලකායේ කර්නල් සේනාවිධායක මේජර් ජෙනරාල් යූඑල්ජේඑස් පෙරේරා ආර්එස්පී යූඑස්පී එන්පීඑස් පීඑස්සී ජ්‍යෙෂ්ඨ නිලධාරි හා සේවා වනිතා ශාඛාවේ සභාපතිනි ඉරේෂා පෙරේරා මහත්මිය ප්‍රධාන ආරාධිත අමුත්තන් ලෙස එක් විය.













## දියපන්දු තරඟාවලියේ ජයග්‍රාහකයින්

1. 2025 ජනවාරි මස 12 සහ 13 දිනයන්හිදි යුහශාඅපුපා පිහිණුම් තටාකයේදි පැවති අන්තර් රෙජිමේන්තු විවෘත දියපන්දු තරඟාවලියේදි මෙම රෙජිමේන්තු කණ්ඩායම ශූරතාවය දිනාගෙන ඇත.

2. එමෙන්ම, එම තරඟාවලියේ මෙම රෙජිමේන්තු ආධුනික දියපන්දු කණ්ඩායම අනු ශූරතාවය දිනාගන්නා ලදි.

3. තවද, 2025 ජනවාරි මස 16, 17, 18 යන දිනයන්හිදි යුහශාඅපුපා පිහිණුම් තටාකයේදි පැවති අන්තර් රෙජිමේන්තු ආධුනික පිහිණුම් තරඟා--වලියේදි මෙම රෙජිමේන්තු ආධුනික පිහිණුම් කණ්ඩායම අනුශූරතාවය දිනාගැනීමට සමත්විය.





## ගෘහස්ථ ඔරු පැදීමේ තරඟාවලිය

2025 ජනවාරි මස 31 හා පෙබරවාරි මස 01 යන දිනයන්හි දියවන්නාවේදි පැවති ජාතික ගෘහස්ථ ඔරුපැදීමේ තරඟාවලියේදි මෙම රෙජිමේන්තුව වෙත අයත් පහත නම් සඳහන් ක්‍රීඩක ක්‍රීඩිකාවන් ජයග්‍රහණයන් හිමිකරගෙන ඇත.

සෙ/679340 සැරයන් බංඩාර ඒඑම්ඩිපිකේ - රන් පදක්කම
සෙ/680377 ලා/කෝ චාමික එම්එම්එන් - රිදී පදක්කම
සෙ/681642 ලා/කෝ සේනානායක එස්ඒඑන්ටි - රන් පදක්කම
සෙ/681704 ලා/කෝ කෞෂල්‍යා බිආර් - රන් පදක්කම
සෙ/681710 ලා/කෝ මුණසිංහ ඒඑච්ආර්එන්කේ - රන් පදක්කම





## මුෂ්ඨි ප්‍රහාරක ජයග්‍රහණ




2025 ජනවාරි මස 23 සිට 26 වන දින දක්වා ගාලු මුවදොර ක්‍රීඩාංගණයේදි පැවති ජාතික මුෂ්ඨි ප්‍රහාරක තරඟාවලියේදි මෙම රෙජිමේන්තුව නියෝජනය කරමින් සහභාගි වූ පහත නම් සඳහන් ක්‍රීඩකයන් ජයග්‍රහණයන් හිමිකරගෙන ඇත.

සෙ/679741 සැරයන් චන්ද්‍රබණ්ඩාර පීඑම්එල්එල් - 7 පොහේබ (කිඃග්‍රෑ 71 බර පන්තිය - රන් පදක්කම)

සෙ/680975 කෝප්‍රල් සුදම්ම වයිඑස්පි - 3 පොහේබ (කිඃග්‍රෑ 75 බර පන්තිය - රිදී පදක්කම)

ක්‍රීඩා

# දියවන්නා තරණය







2025 පෙබරවාරි මස 24 හා 25 යන දිනයන්හි දියවන්නාවේදි පැවති ආරක්ෂක සේවා ඔරුපැදීමේ තරඟාවලියේදි මෙම රෙජිමේන්තුව වෙත අයත් පහත නම් සඳහන් ක්‍රීඩකයින් ජයග්‍රහණයන් ලබාගෙන ඇත.

සෙ/679340 සැරයන් බංඩාර ඒඑම්ඩීපිකේ - ලෝකඩ පදක්කම
සෙ/679460 සැරයන් සේනාරත්න එච්එම්එස්ජ් - ලෝකඩ පදක්කම
සෙ/679527 සැරයන් ප්‍රසාද් ඊපිඑන් - රන් පදක්කම
සෙ/681642 ලා/කෝ සේනානායක එස්ඒඑන්ටි - රන් පදක්කම
සෙ/681704 ලා/කෝ කෞෂල්‍යා බිආර් - රිදී පදක්කම
සෙ/681710 ලා/කෝ මුණසිංහ ඒඑච්ආර්එන්කේ - රිදී පදක්කම

# Dubai 2025 World Para Athletics



2025.02.06 වන දින සිට 2025.02.13 වන දින දක්වා ඩුබායි හිදි පැවති **Dubai 2025 World Para Athletics Grand prix - 16th Fazza International Para Athletics Championships** තරඟාවලිය වෙනුවෙන් සහභාගි වූ මෙම රෙජිමේන්තුව වෙත අයත් සෙ/678878 බනි 11 දුලාන් කේජ්එස් යන බලලත් නිලධාරි **F**44 කාණ්ඩය යටතේ හෙල්ල විසිකිරීමේ ඉසව්වේ රන් පදකකම දිනාගැනීම.

# ජාතික වෙරළ කබඩි තරඟාවලිය



2025 පෙබරවාරි මස 07 සහ 08 යන දිනයන්හිදි හෙයියන්තුඩුව ජාතික තරුණ සේවා සභා කෘතිම වෙරළ ක්‍රීඩා පිටියේදී පැවති ජාතික තරුණ සේවා සභාව සහ **Vision Sport Club** විසින් සංවිධානය කරන ලද ජාතික වෙරළ කබඩි තරඟාවලියේදි මෙම රෙම කබඩි සංචිතය සුපර් ලීග් වටයේ අනුශූරතාවය ලබාගන්නා ලදී.



# අන්තර් රෙජිමේන්තු ප්‍රායෝගික රයිෆල් වෙඩිතැබීමේ තරඟාවලිය

2025 පෙබරවාරි මසදී දියතලාව ක්ෂේත්‍ර වෙඩි පිටියේදි පැවති 2025 අන්තර් රෙජිමේන්තු ප්‍රායෝගික රයිෆල් වෙඩිතැබීමේ තරඟාවලියේදි මෙම රෙජිමේන්තු වෙඩි තැබීමේ කණ්ඩායම සේවා ඒකකයන්හි දෙවන ස්ථානය හිමිකර ගන්නා ලදී.

## මුහුදු සැතපුම් දෙක පිහිණුම් තරඟාවලිය

2025 පෙබරවාරි මස 28 වන දින ගල්කිස්ස මුහුදු තීරයේදී පැවති අන්තර් රෙජිමේන්තු මුහුදු සැතපුම් දෙක පිහිණුම් තරඟාවලියේදී මෙම රෙම පිහිණුම් කණ්ඩායම අන්තර් රෙජිමේන්තු සම ශූරතාවය සහ සමස්ථ ශූරතාවය ලබාගන්නා ලද අතර□ එහිදි මෙම රෙම වෙත අයත් සෙ/680871 සාසෙ නිරෝෂන ආර්බිඩි - 1 පොහේබ යන සෙනී එහි ප්‍රථම ස්ථානය ලබාගන්නා ලදී






## ධාපැදි ධාවන ශූරයා




සෙ/680289 කෝප්‍රල් මධුරංග බිඅයි - 5 ශ්‍රීලයුපොහේබ යන කොනොනි පහත දක්වා ඇති ධාවන ඉසව් සඳහා සහභාගි වී එම ඉසව් ඉදිරියෙන් දක්වා ඇති දක්ෂතාවයන් පෙන්වා ඇත

1. 2025 පෙබරවාරි මස 25 වන දින මාතර එළිය කන්ද ධාවන පථයේදි පැවති එළියකන්ද මෝටර් ක්‍රොස් ධාවනපැදි තරඟාවලියේදි 250 සිසි සුපර් මෝර්ටාඩ් ඉසව්වේ ප්‍රථම ස්ථානය ලබාගෙන ඇත

2. 2025 මාර්තු මස 30 වන දින කටුකුරුන්ද ගුවන් හමුදා ධාවන පථයේදි පැවති **KATUKURUNDA CIRCUIT MEET** - 2025 ධාවනපැදි තරඟාවලියේදි 250 සිසි සුපර් මෝර්ටාඩ් ඉසව්වේ දෙවන ස්ථානය ලබාගෙන ඇත

3. 2025 අප්‍රෙල් මස 06 වන දින නුවරඑළිය මාගස්තොට ධාවන පථයේදි පැවති **MAGASTHOTA FASTIVAL OF SPEED** ධාවනපැදි තරඟාවලියේදි 250 සිසි සුපර් මෝර්ටාඩ් ඉසව්වේ ප්‍රථම ස්ථානය ලබාගෙන ඇත

4. 2025 අප්‍රෙල් මස 07 වන දින නුවරඑළිය ධාවන පථයේදි පැවති **SINGLE TREE HILL CLIMB** ධාවනපැදි තරඟාවලියේදි 250 සිසි සුපර් මෝර්ටාඩ් ඉසව්වේ ප්‍රථම ස්ථානය ලබාගෙන ඇත

5. 2025 අප්‍රෙල් මස 27 වන දින ගිරිඋල්ල මහමේරුව ධාවන පථයේදි පැවති **MAHAMERUWA RALLY CROSS** - 2025 ධාවනපැදි තරඟාවලියේදි 250 සිසි සුපර් මෝර්ටාඩ් ඉසව්වේ දෙවන ස්ථානය ලබාගෙන ඇත

## සෙපැක්ට්‍රැක්රෝ තරඟාවලිය



2025 මාර්තු මස 07 වන දින පනාගොඩ ගෘහස්ථ ක්‍රිඩාගාරයේදි පැවති 2025 අන්තර් රෙජිමේන්තු සෙපැක්ට්‍රැක්රෝ තරඟාවලියේදි මෙම රෙම පාපන්දු කණ්ඩායම අනුශූරතාවය ලබාගන්නා ලදී

## කායවර්ධන ජයග්‍රහන







2025 මැයි මස 07□ 08 සහ 09 යන දිනයන්හිදි පනාගොඩ යුද්ධ හමුදා කායවර්ධනාගාරයේදි පැවති අන්තර් රෙජිමේන්තු කායවර්ධන□ බරඉසිලීමේ සහ සවිඑසවීමේ තරඟාවලියේදි මෙම රෙම වෙත අයත් පහත නම් සඳහන් අයවලුන් ජයග්‍රහණයන් ලබාගෙන ඇත

සෙ/679173 කෝප්‍රල් ජයරත්න ජේඒඑම්එස් - 5 පොහේබ
(සවි එසවීමේ ඉසව්වේ කිःග්‍රෑ 120 ට වැඩි බරපන්තියේ ප්‍රථම ස්ථානය)
සෙ/679547 කෝප්‍රල් බංඩාර කේඑම්එන්සි - 3 පොහේබ
(කායවර්ධන ඉසව්වේ කිःග්‍රෑ 90 බර පන්තියේ තුන්වන ස්ථානය)

# විනයාරක්ෂකාධිපති ඒකක සංචාර

**1 ශ්‍රීලයුපොහේබ, 5 ශ්‍රීලයුපොහේබ සහ විවිඒ - 2025/05/27**







**2 ශ්‍රීලයුපොහේබ සහ පොහේබ පුපා - 2025/05/26**







**3 ශ්‍රීලයුපොහේබ - 2025/05/26**







**4 ශ්‍රීලයුපොහේබ - 2025/05/25**





**නිඅහපි (මුල) - 2025/05/25**





ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ විනයරක්ෂකාධිපති මේජර් ජෙනරාල් ආර්ඩී සලේ එන්ඩීසී ජ්‍යෙෂ්ඨ නිලධාරි සිය තනතුරේ රාජකාරි අත්හැරීමට ප්‍රථම ශ්‍රීලයුපොහේබ ඒකකයන්හි නිරික්ෂණ සංචාරයන්හි නිරත විය. මෙහිදි ඒකකයන් වෙතින් සාම්ප්‍රධායානුකූලව විනයාරක්ෂකාධිපති පිළිගන්නා ලදි.

## විශ්‍රාම යාමට ප්‍රථම කර්නල් සේනාවිධායක තුමාගේ ඒකක සංචාර

2 ශ්‍රීලයුපොහේබ





3 ශ්‍රීලයුපොහේබ





4 ශ්‍රීලයුපොහේබ





7 ශ්‍රීලයුපොහේබ





ශ්‍රීලයුපොහේබ නිඅභපි (මූල)




පොහේබ පුහු





ශ්‍රී ලංකා යුද්ධ හමුදා යුද සේවා ලේකම් මෙන්ම ශ්‍රී ලංකා යුද්ධ හමුදා පොලිස් හේවා බලකා කර්නල් සේනාවිධායක මේජර් ජෙනරාල් යූඑල්ජේඑස් පෙරේරා ආර්එස්පි යූඑස්පි එන්පිඑස් පිඑස්සි යන ජ්‍යෙෂ්ඨ නිලධාරි විශ්‍රාම ගැනීමට ප්‍රථම ශ්‍රීලයුපොහේබ ඒකකයන්හි නිරීක්ෂණ සංචාරයන්හි නිරතවිය. යුද්ධ හමුදා සම්ප්‍රදායන්ට මුල්තැන දෙමින් පිළිගැනීම සිදුකල අතර, එහිදී සියලු නිලයින් ඇමතීම අතුලු විවිධ උත්සව අවස්ථාවන් සඳහා සහභාගි වන ලදි.

## මේජර් ජෙනරාල් නිලයට උසස්වීම නිමිත්තෙන් උපහාර පිදීම







ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ විනයාරක්ෂකාධිපති මේජර් ජෙනරාල් ආර් ඩී සලේ එන්ඩීසී ජ්‍යෙෂ්ඨ නිලධාරි 2025 මැයි මස 19 වන දින බ්‍රිගේඩියර් නිලයේ සිට මේජර් ජෙනරාල් නිලය දක්වා උසස්වීම ලබන ලදි.

මෙම නිල උසස්වීම නිමිත්තෙන් ශ්‍රී ලංකා යුද්ධ හමුදා පොලිස් සේවා බලකා රෙජිමේන්තු මධ්‍යස්ථානයේදී 2025 මැයි 23 වන දින උපහාර පිදීමේ උත්සවයක් පවත්වන ලදි.



## නිලධාරි පුහුණුවීම් දිනය

2025.02.17







2025.06.13







ශ්‍රී ලංකා යුද්ධ හමුදා පොලිස් සේවා බලකායේ නිලධාරි පුහුණු වැඩසටහන 2025 පෙබරවාරි මස 17 සහ 2025 ජුනි 13 දින දිනන්හීදි රෙජිමේන්තු මධ්‍යස්ථානයේදි පැවැත්විනි. නිලධාරින්ගේ වෘත්තීයභාවය සහ කණ්ඩායම් හැගීම වැඩි දියුණු කිරිම සඳහා මෙම වැඩසටහන පවත්වන ලදී. මේ සඳහා මෙම රෙජිමේන්තුව යටතේ රාජකාරි කරනු ලබන ජ්‍යෙෂ්ඨ/කණිෂ්ඨ නිලධාරින් සහභාගි වන ලදී.

## සේවා වනිතා ශාඛා සභාපතිනියගේ ධූරයේ රාජකාරි අත් හැරීම







යුද්ධ හමුදා පොලිස් හේවා බලකා සේවා වනිතා ශාඛාවේ 14 වන සභාපතිනිය ලෙස කටයුතු කරන ලද ඉරේෂා පෙරේරා මැතිණිය එම ධූරයේ වැඩ අත්හැරීම 2025 ජුලි මස 03 දින රෙජිමේන්තු මධ්‍යස්ථානයේදි සිදුකරන ලදී. මේ සඳහා සේවා වනිතා ශාඛාවේ ජ්‍යෙෂ්ඨ සාමාජිකාවන් හා නිලධාරින්/නිලධාරිනියන්ගේ සහභාගිත්වයෙන් සිදුකරන ලදී.

## නව සභාපතිනියගේ රාජකාරි භාර ගැනීම









සේවා වනිතා ශාඛාවේ 15 වන සභාපතිනිය ලෙස ඉරෝෂි ප්‍රනාන්දු මැතිණිය 2025 ජුලි මස 19 දින සුභ මොහොතින් රෙජිමේන්තු මධ්‍යස්ථානයේදි සිය ධූරයේ වැඩ භාරගන්නා ලදී. මේ සදහා සේවා වනිතා ශාඛාවේ ජ්‍යෙෂ්ඨ සාමාජිකාවන්, කර්නල් සේනාවිධායක හා මධ්‍යස්ථාන සේනාවිධායක තුමන් ඇතුලු නිලධාරින් සහ නිලධාරිනියන් සහභාගි වන ලදි.

## ගර්භනි සෙබලියන් වෙනුවෙන් අත්‍යවශ්‍ය ද්‍රව්‍ය හා දිවා ආහාර වේලක් ලබා දීම





යුද්ධ හමුදා පොලිස් හේවා බලකා සේවා වනිතා ශාඛාවේ සභාපතිනිය ඉරෝෂි ප්‍රනාන්දු මැතිණියගේ මගපෙන්වීමෙන් යුතුව මෙම රෙජිමේන්තුව වෙත අයත් ගර්භනි තත්වයේ පසුවන කාන්තා සෙබලියන් වෙත අත්‍යවශය ද්‍රව්‍ය සහිත පාර්සලයක් සහ ප්‍රණිත දිවා ආහාර වේලක් ලබා දීමේ වැඩසටහනක් 2025.07.19 වන දින මෙම රෙජිමේන්තු මධස්ථාන කොනොනි සමාජශාලාවේදී සිදුකරණ ලදී. මේ සදහා සේවා වනිතා ශාඛා සභාපති තුමිය ඇතුලු ජ්‍යෙෂ්ඨ සාමාජිකාවන් /නිලධාරිනියන් හා කාන්තා සෙබලියන් රැසක් සහභාගි වන ලදී.



## අඟ්‍රාපති හකාස අණසක ආසේමු (මධ්‍යම) තනතුර භාර ගැනීම







හකාස අණසක ආඥාපති (මධ්‍යම) හි ආඥාපති වශයෙන් මේජර් ජෙනරාල් ආර්ඩී සලේ එන්ඩීසී ජ්‍යෙෂ්ඨ නිලධාරි සුභ මොහොතින් 2025 ජුනි මස 03 වන දින එම ධුරයේ රාජකාරි ආරම්භ කරන ලදී.

මෙම රාජකාරි ආරම්භ කිරිමේ උත්සවය කඳවුරු මුරයක් ඇතුලුව වැඩසටහන් මාලාවකින් සමන්විත විය. එමෙන්ම මෙම උත්සවය සනිටුහන් කිරිම වෙනුවෙන් පැලයක් රෝපණය කර සියලු නිල ඇමතීමතකින්ද සමන්විත විය.

## නව විනයාරක්ෂකාධිපති තනතුර භාර ගැනීම






බ්‍රිගේඩියර් ඒඑම්ආර් අබේසිංහ එන්ඩීසී යන ජ්‍යෙෂ්ඨ නිලධාරි 2025 මැයි මස 29 දින සුභ මොහොතින් ආගමික වතාවත් සඳහා මුල්තැන දෙමින් ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ 16 වන විනයාරක්ෂකාධිපති ලෙස එම තනතුරේ රාජකාරි ආරම්භ කරන ලදී.

## උපදේශක දායකත්වය

මේජර් ජෙනරාල් බීපීඑස් ප්‍රනාන්දු යුඑස්පී එච්ඩීඑම්සී පීඑස්සී - කර්නල් සේනාවිධායක
මේජර් ජෙනරාල් ඒඑම්ආර් අබේසිංහ එන්ඩීසී - විනයාරක්ෂකාධිපති
බ්‍රිගේඩියර් ආර්එම්කේඒඑස් රාජනායක - මධ්‍යස්ථාන සේනාවිධායක

## කතෘ මණ්ඩලය

මේජර් ආර්පීඩීපී රාජපක්ෂ එල්එස්සී - විධායක අධිකාරී
බනි 1 එච්එම්ඩීසීකේ හීන්කෙන්ද යුඑස්පී
බනි 11 සුභසිංහ ආර්පීජේකේ

## පරිගණක පිටු නිර්මාණය

කෝප්‍රල් මාරසිංහ එම්කේබී
කෝප්‍රල් සංජීව ඩබ්ලිව්ඒඩීඑස්
කෝප්‍රල් යාපාබංඩාර වයිබීඑල්ඩබ්ලිව්ටිඑන්කේ

## ඡායාරූප සැපයීම

රෙජිමේන්තු ඡායාරූප අංශය

